# සැමදා සැමට අවුරුදු වාසනාවන්!

අවුරුදු විසිතුරු අසිරිමත්ය. කවුරු කවුරුත් ඇති හැකි හැටියට අවුරුද්දේ සතුට භුක්තිවිඳිති. මුදල් ඇති අය වැඩි යෙන්ම වියදම්කර අවුරුදු සතුට භුක්තිවිඳිති. මුදල් තිබුණත් අරපරෙස්සම ඇත්තෝ ඊට වෙනස්ව ක්‍රියාකරති. යන්තම් පිරි මහ ගන්නා අයත් පුළුවන් උපරිමයෙන් වියදම්කර අවුරුදු සතුට විඳිති.

හෙටට යමක් ඉතිරිකර තබාගත යුතු අයත් බැරිමරගාතේ වියදම්කර පීඩා විඳිති. ඔවුනට අවුරුදු දවසේ සතුට සියල්ලටම ප්‍රධානයි. එහෙත් ප්‍රමාණයට වියදම් කිරීම කොයිකාටත් කොයි දේටත් වැදගත්ය. පැය හතරක මහල් උළෙලකට රුපියල් ලක්‍ෂ ගණනින් වියදම් කරති. ඒ සතුට අභිමානය හුවා දක්වනු පිණිසය. සතුට පරම ධනයක් බව සැබෑය. එහෙත් තාවකාලික සතුටට වඩා දිගුකාලීන සතුට වැදගත් ය.

කවුරුද සතුට හමුවේ මේවා පිළිපදින්නේ ? “ අවුරුදු හැමදාම නැහැ ” බොහෝ දෙනා එසේ කියා නොසැහෙන්නට වියදම්කරති.





හදිස්සියකට ඉතිරිකර තැබියයුතු දේත් වියදම් කරති. “ හෙට මැරුණත් හිතට සැපයි අද ජොලි කරලා” යයි කියන් නේ නිකම්ම නොවේ.

විශේෂයෙන් අවුරුද්දට බෝතලේ නැතිවම බැරි අයට අවුරුද්ද අවුරුද්දක් නොවේ. ඇතැමුන්ට මත්වතුර බෝතල යෙන් ලබන සතුට නැතිවම බැරිය. කන්නට පෙර දෙකක් (බීම වඩි දෙකක්) කටට හලාගන්නට නොතිබුණොත් වග එල කියන උදවිය දැන් කාලේ පිරිමි අතර සුලබය. ඒ විතරක් නොවේ. දැන් ඉහළ මැද පන්තියට ඒ පන්තියේ කාන් තාවන්ට වයින් නමැති මුද්‍රික සාරය බීමට සලස්වනු ලබයි. මේ පුරුද්ද දැන් පහළ පන්තියටද බෝවී ඇත.

ළඟකදී මෙවන් නිවසක බලපත්‍ර රහිතව පෙරූ මත්පැන් බූලි ළඟ වයින් භාජනය ද තබා තිබුණේ ය. කිසිත් නොදන්නා අයෙක් වයින් වෙනුවට බලපත්‍ර රහිත මත්වතුර වයින් බඳුන්වලට වත්කර කාන්තාවන්ට සංග්‍රහකර තිබේ. ටික වේලාවකින් කාන්තාවන්ගේ හැසිරී මේ වෙනසක් අනෙක් අයට තේරෙන්නට විය. ඒ වනවිට ඔවුන් නොසෑහෙන්න රත්වී සිටි බවද වාර්තා විය.

අළුත් අවුරුද්ද මත්වතුර සඳහා දැන් කොයිතරම් දික්ගැස්සී තිබේද යන්න අවුරුද්ද කිට්ටුවන විටම වයින් ස්ටෝර්ස් යනුවෙන් හැඳින්වෙන බීර අරක්කු විකුණන ස්ථාන අසල ගැවසෙන විශාල ජනකායෙන්ම වැටහේ. අවුරුද්දේ හැම- දෙයක්ම අළුත්ය. අළුත් ඇඳුමක් දරු මල්ලන්ට නැත්නම් එය හිතට හරි නැත. වැඩිහිටියන්ට වඩා දරුවන්ට එය වඩාත් දැනේ. ඒවගේමය, ගේදොර අස් පරස් කර, දුඹුළුකඩා, හැකිනම් අළුතින් සායම් පිරියම් කරත්. අළුත් දොර රෙදි, ජනෙල් රෙදි, කොට්ටඋර අඩු වැඩි වශයෙන් හැමදේම අළුත් ය. නැතිබැරි කෙනෙක් වුවත් සෝදා පිරිසිදුකර නැවුම් බවක් ඒ ආකාරයෙන් හෝ ඇතිකරයි.

ඉර මීන රාශියේ සිට මේෂ රාශියට යන අතර ඇති නොනගත කාලයේ තවමත් පන්සල් ගොස් පින්පෙත් පිරුමේ කාරිය අඩුවැඩි වශයෙන් සිදුවේ. මේ දිනවල පන්සල් වල වැඩියෙන් තරුණ අය ගැවසන බව අපට දැනුණු දෙයකි. ගංගොඩවිල සෝම හාමුදුරුවන්ගේ බණකීමේ කලාව තරුණ පිරිස අතර මේ ප්‍රබෝධයට මුල්වුණු බව බොහෝ දෙනාගේ අදහසයි. හෙට දවස ඒ තරුණයන්ගේය. තරුණි යන්ගේ ය.

ඊයේ තරුණ විය ගත කර අද වැඩිහිටිවියට එළඹි ඇතැමුන්ට තරුණ කටයුතු ඇතැම්විට රුස්සන්නේ නැත. පරම්පරා පරතරය? එකඅතකට එසේ සිතෙන් නට පුළුවන. ඒ වගේම තරුණ පිරිස් හා ගැටෙ මින් මිතුරන්සේ හැසිරෙන මනසින් තරුණ උදවියත් සිටිනබව රහසක් නොවේ.

අවුරුදු සිරිත පණ්ඩිත යන්ට නොව, හදවතින් මේ උළෙල වැළඳගන්නා අය ගේය. අවුරුද්ද කොහෙන් ආවාද? කාගෙන් එක්වුණා ද? මුල කොහේද? මේ ආදී තර්ක විතර්ක පණ්ඩිත යන්ට නම් හොඳයි. අවු රුද්ද හදවතින් වැළඳ ගත යුතු ජාතික උළෙලකි. දැන් ධනාත්මක සිතුවිලි වර්ධ නය කරගන්නට යයි දසතින් ම ඇසේ.

සල්ලි ඇත්නම් අවුරුදු තමයි යන කටට ආවාට කියන කියමන සමග අවුරුද්ද එක්කර ගතයුතු නැත. සල්ලි නැතත් අවුරුද්ද භුක්ති විඳිය හැකිය. පෙබරවාරි අග මාර්තු මුල වනවිට කොහා ගේ කසු කුසුව ඇසෙන්නට පටන් ගනී. නගරයේ පවා ඇත විශාල ගසක කොහා සැඟව අවුරුදු කතාව මතක් කරයි. ඒ හඬ කොතරම් මනරම්ද? ඔබට ඔබේ ළමාවිය මතක් වන්නේ නැතිද?

ළමුනට පරිසරයේ අසිරිය සිහිගන්වන්නේ නැතිද? ගමක් ඇති හැමෝම



අවුරුද්දට ගමේ යති. අවුරුද්දට නගරය ජන ශූන්‍ය කාන්තාරයකි. ගමට නගරයේ සිට තෑගි බෝග ඇති හැකි පමණින් රැගෙන එන නෑයෝ වෙති. ඔවුන් එන්නේ අවුරුදු කීපයකට පසුව විය හැකිය. නැත්නම් අවුරුදු පතා ගමේ එන ගමනේ පුරුද්දටම විය හැකිය. පුංචි තෑග්ගක් වුවත් ලොකු තේරුමක් තිබේ. “ ඒ මට උඹලාව අමතක නැහැ” විදිහේ පැවැත්මකි. එන්නේ අවුරුද්දට සැරයක් විය හැකි ය.

හැමදේම වගේ අවුරුද්දත් වෙනස් වෙලා බව ඇත්තයි. එහෙත් සතුට අඩු වැඩි වේද? නැත්මැයි. සතුට අප පුංචි කාලයේ අම්මා තාත්තා ඇතුළු නෑ සියන් මැද ගෙවන සුන්දර ලෝකයේ අවුරුද්ද අසිරිමත් මතකයකි. එසේ නොවන්නේ නම් එතැන විකෘතියක් විනා ප්‍රකෘතියක් නොවිය හැකිය. එදා මෙදා ගහ කොළ, සතා සීපාවා, කුරුල්ලන් වගේම අපටත් නිදහස සීමාවී ඇති බව සැබෑය. එදා ජනගහනය අඩුය තිබුණ බැඳීම් වැඩිය. දැන් ගමේ රටේ ජනගහනය වැඩිය නන් නාඳුනන් නෝ බොහෝ ය. ගම්වල සංක්‍රමණික ජන සංඛ්‍යාව දැන් ඉතා අධිකය.

දැන් පර්චස් 5-10 යේ ගෙවතු වැඩිය. ළමයින්ට රිසිසේ විනෝදවන්නට වතුපිටි නැත. ඔංචිල්ලා බඳින්නට ඉහළ අතු සහිත ගස් නැත. වෙනකක් තබා අවුරුදු උත්සව පවත් වන්නට ගමක දැන් හරිහමන් පිට්ටනියක් සොයාගත නොහේ. බොහෝ විට හිස් බිම් කඩක අවුරුදු උත්සවයක් පවත්වනු දක්නට ලැබේ. ඉතින් කාලය වෙනස් ය. එහෙත් වෙනස් නොවන එකම දෙය සතුටයි. අළුත් අවුරුද්ද මිනිසුනට සතුට අත්කර දෙනතාක් කල් අවුරුද්ද දිනේවා !

♦ ***පියසේන වික්‍රමගේ***
**Sri Lanka**

Duke's Court Travel
Fly to Colombo

| | | |
|---|---|---|
| SriLankan Airlines | fr £330 | + Taxes |
| Qatar Airways | fr £326 | + Taxes |
| Kuwait Airways | fr £250 | + Taxes |
| Emirates | fr £345 | + Taxes |
| Kingfisher Airlines | fr £330 | + Taxes |

Note: All fares mentioned are low season / terms & conditions apply.
www.easy-flights.tv
020 8748 3535 / 0800 112 0535
204 King Street, London W6 0RA

අපගේ හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට
සාමය සතුට පිරි, සුබ නව වසරක් වේවා!


Sanath Jayasuriya
Global Brand Ambassador Mike Cooke Group

FAST CASH
SEND TODAY - COLLECT TODAY

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව,
දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්‍ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්‍ෂණිකව
හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

Transfer Fees From only £5

COMMERCIAL BANK · BOC BANK OF CEYLON · HNB · HSBC · සම්පත් බැංකුව SampathBank · PEOPLE'S BANK · Standard Chartered

020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT
Strong. Safe. Reliable. MCG Mike Cooke Group
දින 7ම විවෘතයි